1st Place Winner
National Productivity
Award 2020

ISO 9001
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My Ref. CSS/2/20/II  ඔබේ අංකය / உனது இல / Your Ref.  දිනය / திகதி / Date 2023.05. 31

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන, මුදල්, ඉංජිනේරු සේවා, සැලසුම්),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

<u>දකුණු පළාත් සභාවේ පුරප්පාඩුව පවතින අත්‍යාවශ්‍ය රියදුරු තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2022.11.14 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින්, ඔබ ආයතනයෙහි සේවයේ නියුතු රියදුරු තනතුරෙහි සේවයේ යෙදීමට හැකියාවක් සහ කැමැත්තක් දක්වන ප්‍රාථමික සේවා ශ්‍රේණියේ සේවකයන්ගේ තොරතුරු කැඳවන ලද අතර, මාගේ සමාංක හා 2023.02.16 දිනැති ලිපිය මගින් ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමට අදාළ අයදුම්පත් කැඳවන ලදි.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2016 ප්‍රකාරව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 හෝ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 ලබා දීම පිළිවෙළින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාග සමත්වීම හා සමාන ලෙස සැලකිල්ලට ගෙන, එකී සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් ද රියදුරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමට 2023.05.30 දින දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ ප්‍රධානත්වයෙන් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේදී පැවති TUMI රැස්වීමේදී මේ පිළිබඳ සාකච්ඡා වූ අතර ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාව ලබා දෙන ලදි.

04. ඒ අනුව, ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හෝ ඒ යටතේ පවතින ආයතන මගින් රියදුරු තනතුර සඳහා යොමු කරන ලද ප්‍රාථමික සේවා ශ්‍රේණියේ සේවකයන්ගේ අයදුම්පත් අතර රියදුරු වෘත්තියට අදාළ NVQ 3 හෝ NVQ 4 සුදුසුකම් සපුරා ඇති **ස්ථිර පත්වීම් ලද ප්‍රාථමික සේවා ශ්‍රේණියේ නිලධාරීන්** සිටීනම් (2023 වර්ෂයේ ස්ථිර පත්වීම් ලද බහුකාර්ය සංවර්ධන සහායකයින් හැර), ඒ පිළිබඳ තොරතුරු පහත ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කර 2023.06.16 දිනට පෙර මා වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටින අතර, එකී නිලධාරීන්ගේ අයදුම්පත් නැවත යොමු කිරීම අවශ්‍ය නොවන බව ද කාරුණිකව දන්වා සිටිමි.

| අනු අංකය | නිලධාරියාගේ නම | සේවය කරනු ලබන ආයතනය | දුරකථන අංකය |
|---|---|---|---|
| | | | |

අ.පි.බ.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

05. එමෙන්ම, ඔබ විසින් මීට පෙර අයදුම්පත් යොමු නොකරන ලද, උක්ත සුදුසුකම් සපුරන ලද තවත් නිලධාරීන් සිටීනම්, ඒ පිළිබඳ තොරතුරු ද උක්ත ආකෘතියට ඇතුළත් කර මාගේ සමාංක හා 2023.02.16 දිනැති ලිපිය මඟින් යොමු කර ඇති අයදුම්පත්‍රය ද සමඟ මා වෙත යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වමි. (මෙම අයදුම්පත අපගේ නිල වෙබ් අඩවිය වන http://www.cs.sp.gov.lk යන වෙබ් ලිපිනය මඟින් ද ලබා ගත හැක.)

06. තවද, මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලුම ආයතන හා නිලධාරීන් දැනුවත් කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

**සුමිත් අලහකෝන්,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.